# දුරකථනයක් කළ හදියක්



තියුමි දුලිත්නා වේරපිටිය

# පිදුම

කතන්දරයක් ලියන්න කිව්ව
මාගේ සමන්මලී ගුරු මෑණියන්ටයි,
මට හැමදෙයක්ම දෙන
මාගේ අම්මටයි
මම මේ කතාව කියන කොට
අත්පුඩි ගහලා සතුටු වුණු
මාගේ අත්තම්මාටයි
මම මේ පොත පුදනවා.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂී ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවන්ට ගැළපෙන ලෙස නවීකරණය කරමින් " දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතු වන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්'' ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණ අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තයික් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන්, සෙසු පාසල්වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023.11.01

# දුරකථනයක් කළ හදියක්

ඉගෙන ගන්න ගොඩාක් දක්ෂ දරුවෙක් තමයි සෙනුරි කියන්නේ, සෙනුරි හැමදාම පංතියේ පළවෙනියා. ඒ විතරක් නෙමෙයි දෙමව්පියන්ට, ගුරුවරුන්ට කීකරු හොඳ දරුවෙක් තමා සෙනුරි.

මේ පාරත් සෙනුරි පංතියේ පළවෙනියා වුනේ හැම විෂයකටම ලකුණු 90 ට වැඩියෙන් අරගෙන, ඉතින් සෙනුරිගේ අම්මයි තාත්තයි ඒකට ගොඩාක් සතුටු වෙලා සෙනුරිට තෑග්ගක් අරන් දෙන්න තීරණය කළා. අම්මයි තාත්තයි සෙනුරිය අළුත්ම ෆෝන් එකක් අරන් දුන්නා.



ඉතින් සෙනුරිට ගොඩාක් සතුටුයි. තෑග්ග ලැබුණ දා ඉඳලා සෙනුරි හැම වෙලේම ෆෝන් එකත් එක්ක, කාටූන් බලනවා, ගේම් ගහනවා, සින්දු දාගෙන නටනවා, පාසල් යන්න ඕනෙ කමකුත් නෑ. අම්මගේ වදේට තමා උදේට ලෑස්ති වෙලා පාසල් යන්නේ, පාසල් ඇරිලා ආවත් වෙන කිසිම වැඩක් කරන්නේ නෑ. ෆෝන් එක අතේමයි. වෙනදා වගේ පාසලේ වැඩ කරන්නෙත් නෑ. අම්මා තාත්තා කියන දේ අහන්නෙත් නෑ. හැමදාම ගුරුවරුන්ගෙන් බැණුම් අහනවා හරියට වැඩ කරන්නේ නෑ කියලා.



අම්මටයි තාත්තටයි ගොඩක් දුකයි වුන
දේ ගැන. මේ පාර වාර විභාගෙදි
සෙනුරිට ලකුණු ගොඩාක් අඩුයි. සෙනුරි
මේ පාර පංතියේ අන්තිමයා, සෙනුරිට
ගාණක් වත් නැ. ෆෝන් එකේ ගේම්
ගහනවා, සින්දු දාගෙන නටනවා,
කාටුන් බලනවා, අම්මයි තාත්තයි
බැන්නට ගානකුත් නෑ. පංතිභාර ගුරුතුමිය
රිපෝර්ට් දෙන දවසේ සෙනුරිගේ
අම්මවයි තාත්තවයි පාසලට ගෙන්නුවා.
ගුරුතුමිය සෙනුරිගේ අම්මගෙනුයි
තාත්තගෙනුයි ඇහුවා සෙනුරිගෙ
මේ වෙනස ගැන.



අම්මටයි තාත්තටයි හරිම ලැජ්ජයි,
ඒත් ඇත්ත නොකියත් බැරි නිසා
ගුරුතුමියට කිව්වා ෆෝන් එක ගැන.
ගුරුතුමිය හොඳටම බැන්නා අම්මටයි
තාත්තටයි. වහාම ෆෝන් එක සෙනුරිගෙන්
අයින් කරන්න කිව්වා. සෙනුරිගෙ තාත්තා
ගෙදර ආපු ගමන් කරේ ෆෝන් එක
අරන් හංගපු එක. ඊට පස්සේ සෙනුරිව
ළඟට අරන් ආදරෙන් තේරුම් කරා.
සෙනුරි පොරොන්දු උනා ආයෙත් අකීකරු
වෙන්නේ නෑ. හැමදාම පාසල් ගිහින්
හොඳට ඉගෙන ගන්නවා කියලා.
පොරොන්දු උන විදියටම සෙනුරි
ආයෙත් හොඳින් පාඩම් වැඩ කරන්න
පටන් ගත්තා.



ඒ නිසාම ආයෙත් සෙනුරි මේ පාර
හොඳට ළකුණු අරගෙන පංතියේ
පළවෙනියා උනා.
හැමෝටම ගොඩාක් සතුටුයි.
ඉතින් මගේ යාළුවෝ හැමෝටම මම
මේ කතාවෙන් කියලා දෙන ආදර්ශය
තමා දෙමව්පියන්ට, ගුරුවරුන්ට
කීකරුව ඉගෙන ගන්න කාලෙ හොඳට
ඉගෙන ගන්න ඕනෙ කියන එක.



# ස්තූතිය

මගේ කතාවට
චිත්‍ර අඳින්න මට උදවු කරපු
මාගේ අයියාට
(නෙතුප වේරපිටිය)
ගොඩක් ස්තූතියි

# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුල ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැලසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කරු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.


මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ


2023.11.01



තියුමි දුලිත්නා වේරපිටිය
3 ශ්‍රේණිය C
මහාමායා බාලිකා විද්‍යාලය
මහනුවර